නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය (UDA)

# ටෙන්ඩර් දැන්වීමයි

## තලවතුගොඩ පන්නිපිටිය පාරේ පිහිටි ඉඩම් කොටසක් උද්‍යාන අලංකරණ කටයුතු සඳහා බදු දීම සඳහා ටෙන්ඩරය

**කොන්ත්‍රාත් අංකය : PD/UDA/RTB/2022/024**

01. තලවතුගොඩ, පන්නිපිටිය පාරේ (වික්‍රමසිංහපුර හංදියට ආසන්නව) පිහිටි, 2019.10.28 දිනැති අංක 5787 පිඹුරෙහි ලොට් අංක 1 ලෙසට සඳහන් ප්‍රමාණය පර්චස් 9.88 ක් වූ, ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එස්.ජී. රණසිංහ මහතා විසින් මැන සකස් කළ ඉඩම් කොටස, උද්‍යාන අලංකරණ කටයුතු සඳහා වසර දහයක බදු පදනමින් ලබාදීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින්, පහත වගුවේ සඳහන් මූලික වටිනාකමට වඩා ඉහළ මිලක් ලබාදිය යුතු බවට ඉල්ලීමක් කෙරේ.

| ලොට් අංකය | ප්‍රමාණය | මූලික වටිනාකම (රුපියල්) |
|---|---|---|
| 1 | පර්චස් 9.88 | 1,500,000/- |

02. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 2,000.00 + බදු සහිතව මුදලින් ගෙවීමෙන් 2022 දෙසැම්බර් 21 දින සිට 2023 ජනවාරි 04 වන දින දක්වා, පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ, බත්තරමුල්ල, "සෙත්සිරිපාය", 7 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රසම්පාදන ඒකකය වෙතින්, අදාළ ටෙන්ඩර් ලේඛන ලබාගත හැක.

03. තවද, අදාළ ටෙන්ඩර් ලේඛන, බත්තරමුල්ල, "සෙත්සිරිපායේ", 7 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ, ප්‍රසම්පාදන ඒකකයේදී, ටෙන්ඩර් ලේඛන නිකුත් කරනු ලබන කාලය තුළ, කාර්යාල වේලාවන් අතරතුර, නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකිය.

04. සියලුම ටෙන්ඩර් සමග, වටිනාකම රුපියල් 30,000.00 ක් වූ, නාගරික සංවර්ධන අධිකාරිය නමට ගත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත්, ඒක්ෂණ හා කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් බැගින් හෝ එම වටිනාකම මුදලින් ගෙවා ලබාගත් ලදුපත අමුණා තිබිය යුතුය. අදාළ ලංසු ඇපකරය ලංසු අවසන් වන දින සිට දින 270 ක් (2023 ඔක්තෝබර් 02 දින දක්වා) වලංගු විය යුතුය.

05. ටෙන්ඩර් භාරගැනීම, 2023 ජනවාරි 05 දින ප.ව. 2.00 ට අවසන් කරනු ලබන අතර, ඒ හා සමගම, බත්තරමුල්ල "සෙත්සිරිපාය", 6 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශයේදී ලැබී ඇති ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුහට හෝ ඔහුගේ / ඇයගේ බලයලත් නියෝජිතයෙකුහට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

06. යථා පරිදි සම්පූර්ණ කළ ටෙන්ඩර් ලේඛන. ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ආදායම් ටෙන්ඩර් මණ්ඩලය (සුළු), නාගරික සංවර්ධන අධිකාරිය, 6 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල යන ලිපිනයට 2023 ජනවාරි 05 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. නැතහොත්, බත්තරමුල්ල, සෙත්සිරිපායේ, 6 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් අදාළ නිර්දිෂ්ට වේලාවට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ටෙන්ඩර් බහාලූ මුදා, තැබූ කවරයේ වම් ඉහළ කෙළවරේ, "**තලවතුගොඩ ඉඩම බදුදීම සඳහා ටෙන්ඩරය**" යනුවෙන් සඳහන් කළ යුතුය.

07. අවශ්‍ය වැඩිදුර විස්තර ප්‍රසම්පාදන ඒකකයේ ප්‍රධානී වෙතින් හෝ කාර්යාල වේලාව තුළදී, බත්තරමුල්ල, "සෙත්සිරිපාය", 6 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ, ඉඩම් සංවර්ධන හා කළමනාකරණ අංශයෙන් ලබාගත හැක. දුරකථනය : 011-2875916-20 දිගුව - 2938, 2681 හෝ 0113-560673

**සභාපති,**
**ආදායම් ටෙන්ඩර් මණ්ඩලය (සුළු),**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**6 වන මහල, "සෙත්සිරිපාය",**
**බත්තරමුල්ල.**